**දෙවන සෞඛ්‍ය අංශ සංවර්ධන ව්‍යාපෘතිය - 1 සංරචකය - 2016**

**-----------------------------------------------------------------------------**

දෙවන සෞඛ්‍ය අංශ සංවර්ධන ව්‍යාපෘතියේ - සංරචක I හි 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2013 අගෝස්තු 19 දින එළඹි අංක 5228 - එල්කේ දරන මූල්‍ය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

**-----------------------------------------------------------------------------**

මූල්‍ය ගිවිසුම අනුව, එවකට සෞඛ්‍ය අමාත්‍යාංශය වර්තමානයේ සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් ජාතික මට්ටමින් සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් පළාත් මට්ටමින් ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක කිරීම අපේක්ෂා කෙරේ. ව්‍යාපෘති ශක්‍යතා ලියවිල්ල අනුව, 2013 සිට 2017 වර්ෂය දක්වා ජාතික සෞඛ්‍ය සංවර්ධන සැලැස්ම ක්‍රියාත්මක කිරීම සඳහා මූල්‍ය සහය සැපයීමට මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කෙරේ. මන්ද පෝෂණය හා බෝ නොවන රෝග පිළිබඳ අභියෝග සඳහා යහපත් ප්‍රතිචාර දැක්වීමට හැකිවන පරිදි මහජන සෞඛ්‍ය පිළිබඳ කාර්ය සාධන ප්‍රමිතීන් වැඩි දියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. මූල්‍ය ගිවිසුම අනුව රු. මිලියන 25.270 කට සමාන විගැහි (SDR) 129.8 ක් (එ.ජ.ඩො මිලියන 200) වු අතර ඉන් රු. මිලියන 24.006 කට සමාන විගැහි (SDR) 123.31 (එ.ජ.ඩො මිලියන 190) ක් ව්‍යාපෘතියේ සංරචක - 1 හි කටයුතු කරගෙන යාම සඳහා වෙන්කර තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු 2013 ජුලි 01 දින ආරම්භ කරන ලද අතර 2018 සැප්තැම්බර් 30 වන විට නිම කිරීමට නියමිතය. සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය විසින් ජාතික මට්ටමින් ක්‍රියාත්මක කරන ලද කටයුතු පිළිබඳ අදහස් දැන්වීම් මෙම වාර්තාවේ අඩංගු වන අතර ව්‍යාපෘතියේ සංරචක - 1 හි මූල්‍ය ප්‍රකාශන වෙනමම ඉදිරිපත් කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-----------------------------------------------------------------**

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම්වල සම්පාදනයක් වන මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමත් කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

**-----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදි. ආචාරධර්ම වල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැළසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත්වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වල දී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැළසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවු අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති වල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශන වල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත්වේ. මාගේ මතය සඳහා

පදනමක් සැපයීම උදෙසා මාවිසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකණු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුලත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපාතියේ මෙහෙයුම් කටයුතු වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වුයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන වියදම් ව්‍යාපෘතිය පවත්වාගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජයේ සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය සපයන අරමුදල් හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල් වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් හා වගකීම්, ණය වලින් කරන ලද මිලදී ගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුනේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) මුදල් රෙගුලාසි 150 හා 2016 දෙසැම්බර් 09 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 252/2016ට අනුකූලවන පරිදි මූල්‍ය වාර්තා පිළියෙල කර තිබුණේද යන බව.

(උ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(ඌ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 මතය

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2016 විගණනය සඳහා ඉදිරිපත්කළ සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ විසර්ජන ගිණුමට, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 150 හා 2016 දෙසැම්බර් 09 දිනැති අංක 252/2016 රාජ්‍ය ගිණුම් චක්‍රලේඛනයට පදනම්ව මූල්‍ය වාර්තා පිළියෙල කර ඉදිරිපත් කර ඇති බව හා ඉහත විසර්ජන ගිණුම සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය නඩත්තු කරන භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත වාර්ෂික අයවැය ඇස්තමේන්තු පොත්පත්, ලේඛන හා වාර්තා සමග එකග වී ඇති බව.

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඈ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 2.2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ගණකාධිකරණ අඩුපාඩු

තායිලන්තයේ පැවති රෝහල් මූල්‍යකරණ හා ගිණුම් පුහුණු වැඩසටහනකට සහභාගි වූ රේඛීය අමාත්‍යාංශයේ නිලධාරීන් 59 දෙනෙකුට අදාල ගුවන් ගාස්තු, පාඨමාලා ගාස්තු හා අනියම් වියදම් ලෙස සමාලෝචිත වර්ෂයේ වැයකරන ලද රු. මිලියන 18.17 වාර්ෂික විසර්ජන ගිණුමේ ප්‍රාග්ධන වියදම් සඳහා වෙන්කළ වෙනත් වැය විෂයයන් සංකේත 3ක් යටතේ වැරදි ලෙස ගිණුම්ගත කර තිබුණි.

### 2.2.2 නීති,රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම.

ව්‍යාපෘතියේ ප්‍රධාන කාර්ය මණ්ඩල තනතුරුවලට ඇතුලත් ව්‍යාපෘති අධ්‍යාක්ෂක හා ගණකාධිකාරී තනතුරුවලට රේඛීය අමාත්‍යාංශයට අයත් නිලධාරීන් වැඩ බලන පදනම මත බඳවාගෙන තිබූ අතර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලිපි අංක ඩීඑම් එස්/සී/1/16පීආර්ඕජේ උපදෙස් අනුව එවැනි නිළධාරින් පූර්ණ කාලීන පදනම මත බඳවා ගැනීම් කල යුතු වුවත් ඊට පටහැනිව බඳවා ගැනීම් කර තිබුණි. මෙම කරුණ මාගේ පසුගිය වාර්තාවෙන්ද ඉස්මතුකර දක්වා ඇතත් නිවැරදි කිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

### 2.2.3. මූල්‍ය සම්මුතීන්ට අනුකූල නොවීම

ව්‍යාපෘති ශක්‍යතා ලියවිල්ලට අනුව 2015 පෙබරවාරි 28 දින ආරම්භයේ සිට ව්‍යාපෘති කාලය අවසානය දක්වා පාරිසරික කළමණාකරන රාමුවේ කාර්ය සාධන තක්සේරුවට අනුව පාරිසරික ඇගයීමක් කොට වාර්තා පිළියෙල කළ යුතුය. සමාලෝචිත වර්ෂයේදී ව්‍යාපෘතිය මෙම අවශ්‍යතාව පිලිබඳ අනුකූලතාවය දක්වා නොමැති අතර මාගේ පසුගිය වාර්තාවෙන්ද මෙය ඉස්මතුකර දක්වා තිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

### 3.1. අරමුදල් උපයෝජනය

අරමුදල් මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ හා 2016 දෙසැම්බර් 31 දිනට අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කීපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමට අනුව මූල්‍යනය සදහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සදහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම් | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2016 වර්ෂය තුල | | 2016 දෙසැම්බර් 31 දිනට | |
| | ඇ.එ.ජ. ඩොලර් මිලියන | රු. මිලියන | රු. මිලියන | ඇ.එ.ජ. ඩොලර් මිලියන | රු. මිලියන | ඇ.එ.ජ. ඩොලර් මිලියන | රු. මිලියන |
| ජාත්‍යන්තර සංවර්ධන සංගමය සංරචක - 1 | 190.00 | 24,006 | 2324.5 | 6.63 | 973.92 | 9.36 | 1,357.77 |
| | --------- | --------- | ---------- | ------ | --------- | ------ | ----------- |
| | **190.00** | **24,006** | **2,324.5** | **6.63** | **973.92** | **9.36** | **1,357.77** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතියේ ඇගයීම් ලියවිල්ලට අනුව ජාත්‍යන්තර සංවර්ධන සංගමය සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 6,562.5 කට සමාන ඇ.එ.ජ. ඩොලර් මිලියන 43.75 ක් වියපැහැදම් කිරීමට අපේක්ෂිත විය. කෙසේ වෙතත්, රේඛීය අමාත්‍යාංශය සඳහා රු.මිලියන 2,324.50 ක් සහ පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශ සඳහා රු.මිලියන 3,306 ක් පමණක් සමාලෝචිත වර්ෂය තුළ අයවැය ඇස්මේන්තුවල ප්‍රතිපාදනය කර තිබුණි. එම ප්‍රතිපාදනයෙන් රු.මිලියන 973.92 නියෝජනය වන සියයට 41.90 ක් පමණක් සමාලෝචිත වර්ෂය තුළ උපයෝජනය කර තිබුණි.

(ආ) ඉහත තොරතුරු අනුව ව්‍යාපෘතිය යටතේ මුළු ප්‍රතිපාදනය වූ රු. මිලියන 24.006 ට සමාන ඇ.එ.ඩො. මිලියන 190 න් රු. මිලියන 1,357.77 කට සමාන ඇ.එ.ඩො. මිලියන 9.36 නියෝජනය වන මුළු ප්‍රතිපාදනයෙන් සියයට 5.65 ක් පමණක් 2016 දෙසැම්බර් 31 දිනට රේඛීය අමාත්‍යාංශය උපයෝජනය කර තිබුණි. එම නිසා මුළු ප්‍රතිපාදන ඉතිරි වසර 2 ක ව්‍යාපෘති කාලය තුළ ප්‍රයෝජනයට ගැනීමේ හැකියාව අවිනිශ්චිතය.

**3.2 භෞතික ප්‍රගතිය**

-----------------

ව්‍යාපෘතියේ භෞතික ඉලක්ක වියපැහැදම් වලට අදාල දර්ශක 03ක් හා වියපැහැදම් වලට අදාල නොවන දර්ශක 11ක් යටතේ ලගාකර ගැනීමට අපේක්ෂිත විය. අභිලාෂ ප්‍රතිඵල සඳහා ලැබුණු තොරතුරු අනුව වියපැහැදම් අදාල වන දර්ශක 03ක හා වියපැහැදම් අදාල නොවන දර්ශක 11න් 09ක් ලගාකර ගෙන තිබුණි. වියපැහැදම් අදාල වන දර්ශක යටතේ සඳහන් ඉලක්ක ලභාකර ගැනීම් පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) ව්‍යාපෘතියේ ක්‍රියාකාරී සැලසුම අනුව වියපැහැදම් වලට අදාල දර්ශක - 01 යටතේ ශ්‍රී ලංකාවේ ආරෝග්‍යශාලාවල හදිසි ප්‍රතිකාර සේවා වැඩිදියුණු කිරීම සඳහා දිවයිනේ ආරෝග්‍යශාලාවල අලුතින් හදිසි ප්‍රතිකාර ඒකක 14 ක් හා දැනට පවතින හදිසි ප්‍රතිකාර ඒකක 14ක වැඩි දියුණු කිරීමට අපේක්ෂිතය. විගණන පරීක්ෂණයන්ට අනුව 2016 දෙසැම්බර් 31ට දැනට පවතින හදිසි ප්‍රතිකාර ඒකක 9ක් වැඩිදියුණු කිරීමේ කොන්ත්‍රාත්තු අවසන් කර තිබුණි. ව්‍යාපෘතිය ආරම්භ කර වසර 2 ක් ගතවීමෙන් පසුව 2015 දී රු. මිලියන 1.192 ක පිරිවැයකට ප්‍රතිකාර ඒකක 4ක් අලුත් ඉදිකිරීම් කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණි. කළුතර හා පොලොන්නරුව ප්‍රධාන ආරෝග්‍යශාලා යාපනය

ශික්ෂණ රෝහල හා කල්මුනේ මූලික රෝහල ඉදිකිරීම්වල භෞතික ප්‍රගතිය 2016 දෙසැම්බර් 31 දිනට සියයට 50 සිට 85 දක්වා පරාසයක පැවතුණි.

(ආ) ව්‍යාපෘතියේ ක්‍රියාකාරී සැලසුම් වියපැහැදම් අදාල නොවන දර්ශක - 09 යටතේ සාමාන්‍ය ජනතාව දැනුවත් කිරීම හා නවීන අනාවරණය කිරීම් තාක්ෂණයෙන් ක්ෂය රෝගීන් හඳුනා ගැනීමේ අනුපාතය ඉහල දැමීමේ අරමුණින් දිවයින පුරා පුද්ගලයින් 13,577 කගේ ක්ෂය රෝග අනාවරණය කිරීමේ පරීක්ෂණ කිරීමට බලාපොරොත්තු විය. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය පුරා පුද්ගලයින් 9,293ක් පමණක් අනාවරණය කර ගෙන තිබුණි. විගණනය පැත්තෙන් බලන කළ ප්‍රධාන වශයෙන් අලුත් ක්ෂය රෝගීන් හඳුනා ගැනීම, රෝගය හඳුනා ගන්නා ආකාරය, රෝගීන් දැනුවත් කිරීම හා අඛණ්ඩ ප්‍රතිකාර මත රඳා පවතී. එමනිසා දැනුවත් කිරීමේ වැඩසටහන්, රෝගය කලින් හඳුනා ගැනීමේ පහසුකම් වැඩිකිරීමට හා ප්‍රතිකාර සඳහා වැඩි අවධානය යොමු කළ යුතුවේ.

(ඇ) වියපැහැදම් අදාල නොවන දර්ශක 01 යටතේ සෞඛ්‍ය ජීවන රටා වයස මධ්‍යස්ථාන හරහා අවුරුදු 40 ට වැඩි පුද්ගලයින්ගේ බෝනොවන රෝග අනාවරණ පරීක්ෂණ පහසුකම් උසස් කිරීමට පියවර ගෙන තිබුණි. ලැබී ඇති තොරතුරු අනුව 2016 වර්ෂයේ පුද්ගලයින් 1,209,843 ක් හා 2015 වර්ෂයේ පුද්ගලයින්1,461,211 ක් පමණක් වෛද්‍ය උපදේශන කටයුතු සඳහා සෞඛ්‍ය ජීවන රටා මධ්‍යස්ථාන වලට සහභාගී වී තිබුණි. ඒ අනුව එම මධ්‍යස්ථාන ජනතාව අතර වෛද්‍ය උපදේශනයන් සඳහා ප්‍රමාණවත් ආකර්ශනයන් වී නොමැති බව හෙළිදරව් විය. තවද බෝනොවන රෝග සම්බන්ධයෙන් හා සෞඛ්‍ය ජීවන රටා මධ්‍යස්ථාන තුලින් ලබාදෙන පහසුකම් පිළිබඳ ජනතාව දැනුවත් කිරීමට ක්‍රියාකල යුතුය.

## 3.3 කොන්ත්‍රාත්තු පරිපාලනය.

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ලැබී ඇති තෙරෙතුරු අනුව 2010 සැප්තැම්බර් මස විදේශ සැපයුම්කරුවන් දෙදෙනෙකු පිලිකා ප්‍රතිකාර සඳහා වූ රු. මිලියන 6,853.46 කට සමාන එ.ජ.ඩො මිලියන 53.38ක් වටිනා 14 Linear Accelerators, 8 Ct Simulators හා 08 Brachytherapy Machine සැපයීමට හා ක්‍රියාත්මක කිරීමට කැමැත්තෙන් කරන ලද යෝජනාව පිලිගත නොහැකි මූල්‍ය කොන්දේසි නිසා ප්‍රතික්ෂේපකර තිබුණි. කෙසේ වෙතත්, අදාල කොන්ත්‍රාත්තුව අලුත් ජාත්‍යන්තර මිල කැඳවීමකින් තොරව එම සැපයුම්කරුට එම මිලටම 2015 දී ප්‍රදානය කර තිබුණි. තවද, 2015 දෙසැම්බර් 02 රු. මිලියන 476 කට සැපයූ Linear Accelerators 2ක් කොන්ක්‍රීට් බංකර ඉදිකල යුතු නිසා යාපනය හා මඩකලපුව ශික්ෂණ රෝහල්වල නිශ්ක්‍රීයව පැවතුණු අතර අදාල මැෂින් 2017 ජූනි 30 දිනටත් සවිකර නොතිබුණි.

## 3.4 මූල්‍ය පාලනයට අදාල කරුණු.

----------------------------------

මුදල් රෙගුලාසි 133(2) හා 2010 ජූනි 26 දිනැති කළමනාකරණ විගණන චක්‍රලේඛ අංක 05ට අනුව රේඛීය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය ව්‍යාපෘතියේ කටයුතු සම්බන්ධයෙන් විගණන සැලසුමක් පිලියෙල කර ක්‍රියාත්මක කළ යුතුය. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂයේදී වෙනම විගණන සැලසුමක් පිලියෙල කර ක්‍රියාත්මක කළ බවට සාක්ෂි නොතිබුණි.

## 3.5 මතභේදයට තුඩුදෙන කරුණු.

--------------------------------

ව්‍යාපෘතිය ආරෝග්‍යශාලාවල මූල්‍ය කලමනාකරණ හා ගිණුම්කරණ පද්ධති වැඩිදියුණු කිරීම සඳහා ජාත්‍යන්තර අනාවරණයන් හා පුහුණු පහසුකම් සැපයීමට පියවර ගෙන තිබුණි. ඒ සඳහා 2015 ජූනි සිට 2016 අගෝස්තු දක්වා අවස්ථා 4කදී තායිලන්තයේ පැවති 5 දින පුහුණු වැඩමුළු වලට, රේඛීය අමාත්‍යාංශයේ ගණකාධිකාරීන් 59ක් සහභාගී වී තිබුණි. පහත සඳහන් මතභේදයට තුඩුදෙන ස්වභාවයේ කරුණු විගණනයේ දී නිරීක්ෂණය විය.

(අ) රේඛීය අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී පළමු වැඩසටහන් 2 හි කණ්ඩායම් ප්‍රධානී ලෙස හා අනිකුත් වැඩසටහන්වල සම්පත් දායක ලෙස සියලුම වැඩසටහන්වලට සහභාගී වී තිබුණි. තවද, රේඛීය අමාත්‍යාංශයේ ජීව වෛද්‍ය ඉන්ජිනේරු අංශයට අනුයුක්ත ගණකාධිකාරී පසුගිය විදේශ පුහුණුවලට සහභාගිවීම පිළිබඳ විස්තර අනාවරණය නොකර අගමැතිවරයාගේ අනුමැතිය ලබාගෙන 2016 වර්ෂයේදී වැඩසටහන් 2කට සහභාගී වී තිබුණි.

(ආ) රේඛීය අමාත්‍යාංශයේ අයවැය ඇස්තමේන්තුවල විදේශ අරමුදල් ප්‍රභවයන් යටතේ ලී බඩු, කාර්යාල උපකරණ හා ගොඩනැගිලි ඉදිකිරීම් ව්‍යාපෘති වල ප්‍රසම්පාදන කටයුතු සඳහා වෙන්කර ඇති රු. මිලියන 18.17ක ප්‍රතිපාදන මාරුකර විදේශ චාරිකා සඳහා ප්‍රයෝජනයට ගෙන තිබුණි. එම කරුණු නිවැරදි කිරීමට ගන්නා ලද ක්‍රියාමාර්ග පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) සහභාගි නොවීම නිසා 2015 දෙසැම්බර් මාසයේදී අදාල අත්තිකාරම් ආපසු ගෙවා තිබියදී 2016 වැය ලෙජර්වල නිලධාරියකුට ගෙවූ රු 326,916 ක අත්තිකාරම වියදමක් ලෙස වාර්තාකර තිබුණි.

(ඈ) අග්‍රාමාත්‍ය ලේකම්ගේ 1989 නොවැම්බර් 30 දිනැති අංක.පීඑම්/පීඑස්/05 දරන චක්‍රලේඛයට අනුව නිලධාරියා දිවයිනට පැමිණ දින 7ක් ඇතුළත විදේශ චාරිකා පිළිබඳ වාර්තාවක් ඉදිරිපත් කිරීම අවශ්‍ය වන අතර එය නිලධාරීන් 45ක් විසින් සිදුකර නොතිබිණි.